චක්‍රලේඛ අංක - 06/2015

මගේ අංකය - CSD/03/03/14
සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුව
අංක 23, දුම්රියපල පාර
බම්බලපිටිය.
2015-09-17

අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,
සියලුම අධ්‍යක්ෂවරුන්/ නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්/ සහකාර අධ්‍යක්ෂවරුන්,
සියලුම අංශ භාර නිලධාරීන්,
සියලුම බලකා භාර අණදෙන නිලධාරීන්/ පුහුණු කඳවුරු භාර අණදෙන නිලධාරීන්,
හා ව්‍යාපෘති භාර නිලධාරීන් වෙත.

<u>රජයේ නිලධාරීන් ඇප තැබීම</u>

රජයේ මුදල්, ආදායම් මුද්දර හෝ බඩු බාහිරාදිය භාර ගැනීම හෝ භාරව සිටීම, එසේ නැතහොත් රජයේ මුදල් බෙදාහැරීම හෝ මුද්දර නැතහොත් බඩු බාහිරාදිය නිකුත් කිරීම, සම්බන්ධයෙන් පරිපාලනමය විශයෙන් වගකිවයුතු හෝ බලය පැවරීම යටතේ එම කටයුතු පවරනු ලැබ ඇති නිලධාරීන්ද, රජයේ ගිණුමට අදාල වවුචර, සහතික කරන චෙක්පත් අත්සන් කරන අයද ස්වකීය රාජකාරී කටයුතු අවංකව ඉටු කරන බවට 612 වැනි අධිකාරිය වන රජයේ නිලධාරීන්ගේ ඇප ආඥාපනතට අනුකූලව ඇප තැබිය යුතුය.

02. ඒ අනුව මෙම දෙපාර්තමේන්තුවට අනුයුක්ත නිලධාරීන් අතුරින් පහත සඳහන් සේවාවන්ට සහ තනතුරුවලට අයත් නිලධාරීන් ඇප තැබීමට කටයුතු කළ යුතු වන අතර ඒ සඳහා පුද්ගලික ඇප බැඳුම්කරයකට එළඹිය යුතු වේ.

I. සියලුම අධ්‍යක්ෂවරුන්, නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්, සහකාර අධ්‍යක්ෂවරුන්
II. සියලුම බලකා මූලස්ථාන සහ පුහුණු පාසල් අණදෙන නිලධාරීන් සහ දෙවන අණදෙන නිලධාරීන්
III. සරප්වරුන් ඇතුළු මුදල් භාරව කටයුතු කරන සියලුම නිලධාරීන්
IV. ගබඩා භාරකරුවන්
V. ඒකාබද්ධ රියදුරු සේවයේ සහ සිවිල් ආරක්ෂක රියදුරන්

03. මේ සඳහා අදාල නිලධාරීන් විසින් රාජ්‍ය සේවා අන්‍යොන්‍ය ඇපකාර සංගමයේ සාමාජිකත්වය ලබා ගත යුතු වන අතර ඒ සඳහා රු. 2,500.00 ක මුදලක් එම සංගමයේ ගිණුම වෙත බැර කළ යුතු වේ. මෙහිදී දෙපාර්තමේන්තුව මගින් වැටුප් ලබන නිලධාරීන් සඳහා එම මුදල රු 500.00 බැගින් වන වාරික 05 කින් ලබන මස සිට වැටුපෙන් අයකිරීමට කටයුතු කරනු ලබන අතර දෙපාර්තමේන්තුවෙන් වැටුප් නොලබන නිලධාරීන් 2015-09-30 දිනට පෙර ගිණුම් හා ගෙවීම් අංශය වෙත අදාල මුදල ගෙවීමට කටයුතු කළ යුතු වේ.

04. ඇප තැබීමට අදාල පහත ලේඛන මේ සමඟ අමුණා ඇති අතර ඇප තැබිය යුතු සියලුම නිලධාරීන් එම ආකෘති නිසි පරිදි සම්පූර්ණ කොට සිවිල් පාලන අංශය වෙත භාරදීමට කටයුතු කළ යුතු වේ.

I. M.G.A. 3
II. භාණ්ඩාගාර 153
III. භාණ්ඩාගාර 152
IV. භාණ්ඩාගාර සහ ගණන් පරීක්ෂණ 41
V. පොදු 235

05. මේ සම්බන්ධයෙන් ඔබගේ විශේෂ අවධානය යොමු කරන ලෙස මෙයින් දන්වනු ලැබේ.

චන්ද්‍රරත්න පල්ලේගම
අධ්‍යක්ෂ ජනරාල්

24

රාජ්‍ය සේවා
[illegible]
ඇපකාර සංග්‍රහය

රාජ්‍ය
නිලධාරීන්ගේ
(ඇප) ආඥාපනත
(352 වැනි
අධිකාරය
වන) 2 (ඇ)

M. G. A. 3
(Conq. Lodger* S. & E. 13½"×17½") 6/73

අ පෝරමය

# විධි වූ පරිදි තිබේ

.....................................
රජයේ අධිනීතිඥ.

අමාත්‍යාංශයේ ලියාපදිංචි කිරීම් අංකය : ...........

.............................................

.................... අමාත්‍යාංශයේ
ලේකම්.

වර්ෂ 19.....................වැනි දය.

සියලු දෙනාම මෙයින් දන ගත යුතුයි

.................................................................................................................. පදිංචි

(මෙහි පහත '' යථෝක්ත නිලධාරියා '' යයි කියනු ලබන)..............................................

.....................................................වන මම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට

ශ්‍රී ලංකාවේ වලංගු මුදලින් රුපියල්.............................................................................

......................................................................................................... වන මුදලකට

නීත්‍යානුකූල ව භාරයේ බැඳෙමි. තවද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට මෙම මුදල මනා ලෙස හා අවංක ලෙසත් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව වෙනුවෙන් ගෙවන බවට යථෝක්ත නිලධාරියා වන මම මාද, මගේ උරුමක්කාර, පෝල්මාකාර, අද්මිනිස්ත්‍රාසිකාර යන මේ අය සහ මේ එක් එක් කෙනෙකු ද මෙයින් භාරයේ බැඳ තබමි.

තව ද ඉහත කී අන්දමින් මෙම බැඳුම්කරයට බැඳුනු..................................................................

.................................................................. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව යටතේ සේවයෙහි යෙදී සිටින බැවින් ද, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව යටතේ සේවයෙහි යෙදී සිටින නිලධාරියෙකු වශයෙන් තමා සතු රාජකාරි විධි වූ පරිද්දෙන් ඉටු කරනු සඳහා කලින් කලට තීරණය කළ හැකි වූ යම් ඇපයක් තැබීම ඔහු විසින් කළ යුතු බැවින් ද,

**මෙම බැඳීමේ කොන්දේසිය කෙසේද යත්,** ඉදින් යථෝක්ත නිලධාරියා මේ තාක් කල් ස්වකීය ධූරයට අයත් රාජකාරි මැනවින් හා විධි වූ පරිදි ඉටු කර ඇත්නම්, එසේ ම මින් ඉදිරියට ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව යටතේ සේවය කරන නිලධාරියකු වශයෙන් ක්‍රියා කරන අතරතුරේදී ද සියලු කල්හි ම, ස්වකීය ධූරයට අයත් රාජකාරි මැනවින් හා විධි වූ පරිදි ඉටු කෙරේ නම්, තව ද යථෝක්ත ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපතිවරයා විසින් යථෝක්ත ධූරය සම්බන්ධයෙන් ඔහුට දෙනු ලබන විධාන සියල්ලක් නැතහොත් ඒ සම්බන්ධයෙන් නියෝග කිරීමට බලය ලත් වෙනත් කෙනෙකු ඒ සම්බන්ධයෙන් ඔහුට දෙන විධාන සියල්ලක් ඔහු අවංකව ඉටුකර ඇත්නම් හා අවංකව ඉටු කෙරේ නම්, තව ද ඉහත කී පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව යටතේ සේවයේ යෙදී සිටින එබඳු නිලධාරියකු වශයෙන් ඔහු විසින් සාධාරණ ලෙස ගෙවිය යුතුව ඇති හෝ ගෙවිය යුතු වන, නැතහොත් ඔහු අතට ලැබුණු හෝ මතු ඔහු අතට ලැබෙන්නාවූ මුදල්, බිල් පත්‍ර නෝට්ටු, මුද්දර සහ මුදල් පිළිබඳ ඇපකර සියල්ලක්, නියම කර ඇති පරිදි ඔහු අවංක ලෙස ගෙවා සහ යොදවා ඇත්නම් නැතහොත් මින් ඉදිරියට අවංක ලෙස ගෙවා යොදවා නම්, එසේ ම ඔහු ඉහත කී පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව යටතේ සේවයේ යෙදී සිටින එවැනි නිලධාරියකු වශයෙන් තමා අතට ලැබුණා වූ ද මතු ලැබෙන්නා වූ ද එවැනි මුදල්, බිල් පත්‍ර, නෝට්ටු සහ මුදල් පිළිබඳ ඇපකර සියල්ලක් ද ලැබීම සහ ගෙවීම පිළිබඳ සත්‍යවූ ද නිවැරදි වූ ද ගිණුම්, ඒවා නිසි පරිදි යෙදවීම් පිළිබඳ වූ නියම වූත් ප්‍රමාණවත් වූත් වවුචර්ද සමග, නියම කරනු ලබන සෑම කල්හිම ඉදිරිපත් කොට ඇත්නම් හා මින් ඉදිරියටත් ඉදිරිපත් කෙරේ නම් තව ද, ඔහුගේ යථෝක්ත ධූරයට නියමිත කාලය ගතවීමේදී නැතහොත් වෙනත් අන්දමකින් එම ධූරය හෙළවරවීමේදී, යථෝක්ත ධූරය සම්බන්ධයෙන් අදළ වන සියලු පොත් පත්, ලිපි ලේඛන, ඒවා භාර ගැනීමට නිසි පරිදි බලයලත්

ධ 026230—25,000 (93/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

25

තැනැත්තා වෙත භාර දෙන්නේ නම්, එසේම ඉහත කී පරිදි ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුව යටතේ සේවයේ යෙදී සිටින එවැනි නිලධාරියකු වශයෙන් ඔහුගෙන් අයවිය යුතු මුදල්, බිල්පත්‍ර, නෝට්ටු, මුද්දර, මුදල් පිළිබඳ ඇපකර යන මේ කිසිවක ශේෂයක් ඇතොත් එය භාර ගැනීමට නියි පරිදි බලයලත් තැනැත්තාට එම ශේෂය ගෙවන්නේ නම්, එවිට මෙම බැඳීම අවලංගුව නිෂ්ප්‍රභාවී යන අතර එසේ නොකළහොත් මෙම බැඳීම සම්පූර්ණ බල සහිත ව ද වලංගු ව ද පවත්නේය.

මෙයට සාක්ෂි වශයෙන් යථෝක්ත නිලධාරියා විසින් පහත සඳහන් ස්ථානයේදී හා දිනයේදී ස්වකීය අත්සන තබන්නට යෙදුණා ඇත.

වර්ෂ 19 ........................................................මස..........................

...............................වැනි ද වන මෙදින........................................ දී

ඉහත නම් සඳහන් අය විසින් පහත සඳහන් අය ඉදිරිපිට අත්සන් තබනා ලදී.

...........................................................
නිලධාරියාගේ අත්සන.

1. නම :

ලිපිනය :

අත්සන :

2. නම :

ලිපිනය :

අත්සන :

දිනය
தேதி
Date } ......................................................

මහත්වරුනි/அன்புடையீர்/GENTLEMEN,

ශ්‍රී ලංකාවේ රාජ්‍ය සේවා අන්‍යෝන්‍ය ඇපකාර සංගමයේ නියෝගමාලාවේ 22(1) වැනි වගන්තියෙන් වුවමනා කරන සහතිකය මේ සමග එවන අතර ම, එකී සංගමයට බැඳීමට මා අපේක්ෂා කරන බව ද එහි නියෝගවලට බැඳී සිටීමට මා කැමැති බව ද මම මෙයින් දන්වා සිටිමි.

இலங்கை அரசாங்க சேவை பரஸ்பர உத்தரவாதச் சங்கத்தின் விதிகளின் 22 (1) ஆம் பிரிவின்படி இத்துடன் சான்றிதழை அனுப்புகையில், சொல்லப்பட்ட சங்கத்தில் சேருவதற்கும், அதன் விதிகளுக்குக் கட்டுப்படவும் விரும்புகிறேன் எனத் தெரிவிக்கிறேன்.

In forwarding the enclosed Certificate required by Section 22 (1) of the Rules of the Sri Lanka Public Service Mutual Guarantee Association, I have the honour to express my desire to join the said Association, and my willingness to be bound by its Rules.

2. නියෝග මාලාවේ 22 (2) වැනි වගන්තියේ ප්‍රකාර රජයට බාර දෙනු පිණිස විධි වූ පරිදි සම්පූර්ණ කරන ලද බැඳුම්කරය මේ සමග එවමි. සංගමයේ ඇප සහතිකය ද අමුණා මේ බැඳුම්කරය ...................................................................... අමාත්‍යාංශයේ ලේකම් වෙත යවන ලෙස ඉල්ලමි.

[අ. පි. බ./ம. ப. பா./P. T. O.

ඒ 06709—1,00,000 (82/11) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

குறித்த விதிகளின் பிரிவு 22 (2) இன் பிரகாரம் முடிக்குக் கொடுப்பதற்காக முறியை முறைப்படி பூர்த்தி செய்து இத்துடன் அனுப்புகிறேன். அன்றியும், அத்துடன் சங்க உத்தரவாதத்தையும் இணைத்து ....................................அமைச்சின் செயலாளருக்கு அனுப்புமாறு வேண்டுகின்றேன்.

I enclose the Bond, duly completed, to be given to the State in terms of Section 22 (2) of the Rules, and request that the Guarantee of the Association may be attached thereto and forwarded to the Secretary, Ministry of.. ........................................

මිට, විශ්වාසී වූ,<br>
உங்கள் உண்மையான<br>
Yours faithfully,

ශ්‍රී ලංකාවේ<br>
රාජ්‍ය සේවා අන්‍යොන්‍ය ඇපකාර සංගමයේ<br>
කාර්‍යාධිකාරී මණ්ඩලය වෙතටයි,<br>
තැ.පෙ. අංක 500, කොළඹ.

முகாமையாளர் சபை,<br>
அரசாங்க சேவை பரஸ்பர<br>
உத்தரவாதச் சங்கம்,<br>
இலங்கை.<br>
அ. பெ. இல. 500, கொழும்பு.

THE BOARD OF MANAGERS,<br>
PUBLIC SERVICE MUTUAL GUARANTEE<br>
ASSOCIATION, SRI LANKA (Ceylon),<br>
P. O. BOX 500, COLOMBO.

බී 024163—60,000 (92/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

භාණ්ඩාගාරය
திறைசேரி
Treasury 152
(F 4* S., T. & E.) 1/68

# රාජ්‍ය සේවා අන්‍යොන්‍ය ඇපකාර සංගමය
அரசாங்க சேவை இருவயினொத்த உத்தரவாதச் சங்கம்
# PUBLIC SERVICE MUTUAL GUARANTEE ASSOCIATION

## සංගමිකයන් බඳවා ගැනීම
துணையுறுப்பினரைச் சேர்த்துக்கொள்ளல்
## ADMISSION OF ASSOCIATES

1. නිලධාරියාගේ නම
உத்தியோகத்தரின் பெயர்
Name of Officer

2. පදවි නාමය
பதவிப் பெயர்
Designation

3. වාර්ෂික වැටුප් මුදල
ஆண்டுச் சம்பளத் தொகை
Amount of salary per annum

4. රක්ෂාවට බඳවා ගෙන ඇත්තේ ස්ථිරව ද තාවකාලිකව ද යන්න
வேலையிலமர்த்தப்பட்டிருப்பது நிரந்தரமாகவா அல்லது தற்காலிகமாகவா
Whether permanently or temporarily employed

5. සේවය තාවකාලික නම්, ඒ තාවකාලික සේවයේ කොන්දේසි සහ නිලධාරියාට ස්ථිර තනතුරක් තිබේ නම්, එය
தற்காலிகமாயின், அவ்வேலையின் நிபந்தனைகளும், குறித்த உத்தியோகத்தருக்கு நிரந்தரப் பதவியேதுமிருப்பின் அதுவும்
If temporary, conditions of such employment and the permanent post, if any, of the Officer

6. ඇප බැඳිය යුතුව ඇති රාජකාරිවල සම්පූර්ණ විස්තර
பிணை கொடுக்கும்படி கோரப்படும் கடமைகளின் முழு விவரங்கள்
Full details of duties in respect of which security is required to be given

7. බැඳුම්කරය උල්ලංඝනය කිරීම වැළැක්වීම පිණිස දෙපාර්තමේන්තුවෙන් කරනු ලබන පරීක්ෂණ ක්‍රියාමාර්ග කවරේද ?
முறியை மீறுது தடுப்பதற்குத் திணைக்களம் கையாளும் தடை எது ?
What departmental check is exercised to prevent a breach of the bond ?

8. ඔඩිටර්-ජනරාල් විසින් මේ නිලධාරියාගේ ගණන් හිලවු නිතිපතා පරීක්ෂා කරනු ලැබේද ?
இவ்வுத்தியோகத்தரின் கணக்குக்களை கணக்குப் பரிசோதகர் தலைமை அதிபதி ஒழுங்காகப் பரிசோதிக்கின்றாரா ?
Does the Auditor-General check the accounts of the Officer regularly ?

9. දැනටමත් මේ නිලධාරියා කිසියම් බැඳුම්කරය කින් මේ සමිතියට බැඳී සිටී ද ? එසේ නම් ඒ බැඳුම්කරවල මුදල් ගණන් ද සඳහන් කරන්න
இச்சங்கத்துடன் இவ்வுத்தியோகத்தர் ஏற்கனவே ஏதாவது முறிகளை வைத்துக்கொண்டுள்ளாரா ? அவ்வாறாயின், அத்தகைய முறிகளின் தேதிகளையும், தொகைகளையும் கூறுக.
Does the officer already hold any bonds with this Association ? If so, please state the dates and amounts of such bonds

10. මුදල් හෝ බඩුබාහිරාදිය හෝ මේ නිලධාරියාගේම ආරක්ෂාව පිට පවතීද ? එසේ නම් යම් කවර අවස්ථාවකදී වුවද ඔහුට භාර ගැනීමට සිදුවන සම්පූර්ණ මුදල් ප්‍රමාණය හෝ බඩු වල සම්පූර්ණ වටිනාකම හෝ වෙන් වෙන් වශයෙන් සඳහන් කරන්න
காசு அல்லது பண்டங்கள் இவ்வுத்தியோகத்தரின் சொந்தப் பாதுகாப்பிலுள்ளவா? அவ்வாறாயின், ஏதாவதொரு வேளை பண்டங்களின் ஆகக்கூடிய பெறுமதியைத் தருக.
Is the officer in physical custody of cash or stores ? If so, give separately the maximum amount of cash or value of stores at any one time

.................................................................

දෙපාර්තමේන්තු ප්‍රධානියා.
திணைக்களத் தலைவர்.
*Head of Department.*

දිනය /தேதி/*Date* : ..........................................

H016694 - 60,000 (2002/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව

සාමාන්‍ය 235
General 235
(E 2* S. & E.) 5/62

යොමු අංකය
Ref. No

# ඇප තීරණය කිරීම පිළිබඳ නිර්දේශය

(352 පරිච්ඡේදය වන)

# රාජ්‍ය නිලධාරීන්ගේ ඇප ආඥාපනත යටතේය
(1255 මු. රෙ.)

# RECOMMENDATION FOR DETERMINATION OF SECURITY

(UNDER THE PUBLIC OFFICERS' SECURITY ORDINANCE (CAP. 352)
(F. R. 1255)

| | |
|---|---|
| 1 නිලධාරියාගේ සම්පූර්ණ නම (පැහැදිලි අකුරෙන්)<br>Full name of officer.(In block letters) | |
| 2 තනතුර වැටුප් ක්‍රමය සහ රාජකාරියේ ස්වභාවය<br>Designation, scale of salary and nature of duties | |
| 3 මුදල් පිළිබඳ වගකීමේ ස්වභාවය, මු. රෙ. 1250 බලන්න<br>(වරකට ළඟ තිබෙන බඩුවල අගය හෝ මුදල්වල ප්‍රමාණය පිළිබඳ විස්තර ආදිය දැක්විය යුතුයි)<br>Nature of Financial responsibilites – *see* F. R. 1250<br>(Particulars such as the value of stores or cash in possession at any one time should also be stated) | |
| 4 නිර්දේශ කරන ඇප මුදල<br>Amount of security recommended | |
| 5 ඇපය නිර්දේශ කරන්නේ ආඥාපනතේ 2 දරන වගන්තියේ කවර උපවගන්තිය යටතේ ද වන බව<br>Under which Sub-section of Section 2 of the Ordinance, the security is recommended | |
| 6 2(බී) දරන වගන්තිය යටතේ නම් ඇප දිය යුත්තේ -<br>If under Section 2(*b*) whether security is to be furnished –<br>(i) එකවර මුදලින් ද?<br>in lump sum?<br>(ii) මුල් තැන්පත් මුදලකින් සහ මාසික කොටස් මුදලින් ද? නැතහොත්<br>by initial deposit and monthly instalments? or<br>(iii) මාසික කොටස් මුදලින් පමණක් ද?<br>by monthly instalments only? | |

29

| | |
|---|---|
| 7. කලින් මේ තනතුර දැරූ තැනැත්තා විසින් ඇප දෙන ලද්දේ නම්, එම ඇපය කොපමණද යන්න, සහ එය දුන් පිළිවෙල (එම මුදලට බලය දුන් ලිපි ගොනුවේ යොමු අංකය සඳහන් කරන්න)<br>The manner and the amount of security furnished by the predecessor in office, if any (Quote Case No. authorising such amount) | — |

8. වෙනත් කරුණු }
REMARKS

..........................................
දෙපාර්තමේන්තු ප්‍රධානියා
*Head of Department.*

දිනය }
*Date* } ..........................................

ස්ථානය }
*Place* } ..........................................

සටහන් සහ අදහස්
Notes and Comments

.......................................... අමාත්‍යාංශය

අංකය : ..........................................

ඔබේ අංකය : ..........................................

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුවේ සේවයෙහි නිලධාරියකු වශයෙන් රක්ෂාව කරගෙන .......................................... යන අතර තමා විසින් විධි වූ ප්‍රකාර ඉෂ්ට කරනු ලබන රාජකාරි සඳහා, .. .......................................... මහතා විසින් (352 වැනි පරිච්ඡේදය වන) රාජ්‍ය නිලධාරීන්ගේ (ඇප) ආඥාපනතේ 2 වැනි වගන්තිය යටතේ මෙහි පහත දක්වනු ලබන ආකාරයට රුපියල් .......................................... (රු. ..........................) ක මුදලක් ඇප තැබිය යුතු බැව් තීරණය කර තිබේ :—

| * කවර වගන්තිය යටතේ ද යන වග | | | | මුදල රුපියල් |
|---|---|---|---|---|
| 2 (අ) | ... | ... | ... | .................. |
| 2 (ආ) | ... | ... | ... | .................. |
| 2 (ඇ) | ... | ... | ... | .................. |
| 2 (ඈ) | ... | ... | ... | .................. |
| | මුළු ගණන | | ... | |

..........................................

.......................................... අමාත්‍යාංශය.

19............................................ කොළඹ දී ය.

* අනවශ්‍ය වචන කපන්න.

ස 047518 — 50,000 (97/12) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රිතයි